**මූතූර් ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මූතූර් ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මූතූර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීම , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොත් අගය රු.760,000ක් වූ රෝද හතරේ ට්‍රැක්ටරය සමාලෝචිත වර්ෂයේ විකිණීමෙන් ලද මුදල රු.150,000ක් පමණක් මෝටර් රථ ගිණුම බැර කර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම්වල නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කල යුතුය. |
| (ආ) | යන්ත්‍රෝපකරණවලින් සමාලෝචිත වර්ෂයේ ලැබූ ආදායම් හා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තු(EPL) එකතුව රු.160,400ක් ආපසු ගෙවිය යුතු තැන්පතු ලෙස ගිණුම් ගතකර තිබුණී. | හරස් සටහන් මගින් සභාවේ ආදායමට මාරුකිරීමට පියවර ගෙන ඇති බව. | සභාවේ ආදායම් නියමිත කාල පරිච්ඡේදයට ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | මුතුර් ළමා උද්‍යානයට උපකරණ සවිකිරීමේ කාර්යයට වැයකල රු.3,895,402ක් ප්‍රාග්ධනිත කර නොතිබුණී. | 2023 වර්ෂයේ අවසන් ගිණුම්වල නිවැරදි කරන බව. | ස්ථාවර වත්කම්වල වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ සභාවට පරිත්‍යාග කළ එකතුව රු. 406,699 ක් වූ උපකරණ වල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණී. | -එම- | ගිණුම් නිවැරදි කල යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා ලැබිය යුතු සේවක වැටුප් සහ සභික දීමනා එකතුව රු. 4,510,204ක් ගිණුම් ගතකර තිබුණී. | -එම- | -එම- |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| ඉදිරිපත් නොකළ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.203,987,206 ක් වටිනා ගිණුම් ශේෂ 03 ක් හිමිකම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛන, ශේෂ සනාථ කිරීම් සහ ප්‍රත්‍යාගණන වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | ලේඛණ සම්පූර්ණ කර ඉදිරිපත් කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සියළුම ගිණුම් ශේෂ සනාථ කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 182 වගන්තිය | අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන 2021 මූල්‍ය වර්ෂයේ ආරම්භක වරිපනම් හිඟ ශේෂයෙන් රු. 2,324,357ක් කපාහැර තිබුණි. | පළාත් පාලන කොමසාරිස් වරයා මගින් ගෞරව ආණ්ඩුකාරවරයා ගේ අනුමැතිය ලබාගැනීමට යවා ඇති බව. | ආදායම් ලියාහැරීමේදී විෂය භාර අමාත්‍යාවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. |
| (ආ) ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 371 | වර්ෂ 15කට අධික කාලයක සිට පැවැත එන රු.11,129,351 අත්තිකාරම් මේ දක්වා නිරවුල් කර නොතිබුණි. | දීර්ඝකාලයක සිට පැවැත එන අත්තිකාරම් ගැලපීම් කිරිමට ආණ්ඩුකාරවරයා ගේ අනුමැතියට යවා ඇති බව. | අත්තිකාරම් පියවිය යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 1645 | ලොග් සටහන් පොත් පවත්වාගෙන තිබූ නමුත් ඒවා යාවත්කාලීන කර නොතිබුණි. | ලොග් සටහන් පොත් යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතින බව. | ලොග් සටහන් පොත් යාවත්කාලීන කළ යුතුය. |
| (iii) මුදල් රෙගුලාසි 1646 | සභාවේ භාවිතයේ පවතින වාහන 14ක දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශවල මුල් පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සියළුම වාහන සඳහා දෛනික ධාවන සටහන් නියමිත දිනයේ විගණනයට ඉදිරිපත් කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ඇ) අනෙකුත් චක්‍රලේඛ

| | | | | |
|---|---|---|---|---|
| (i) | 2021 අගෝස්තු 16 දිනැති අංක PT/03/2021 දරන පළාත් මූල්‍ය චක්‍රලේඛය | ප්‍රාදේශීය සභාවේ රාජකාරි ඉටුකරනු ලබන, ආරක්ෂිත ඇපමුදල් තැන්පත් කළ යුතු නිලධාරීන් 16කගෙන් රු.83,000ක ඇප තැන්පතු මුදල් අයකර නොතිබුණි. | ආරක්ෂිත ඇපමුදල් අයකළ යුතු නිලධාරීන්ගෙන් අයකිරීමට කටයුතු කරන බව. | ආරක්ෂිත ඇපමුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 2008 පෙබරවාරි 25 දින ප්‍රසිද්ධ කළ අංක 1553/16 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය | පරිසර ආරක්ෂණ බලපත්‍ර කල්ඉකුත් වීමට මාස 03කට පෙර පරිසර ආරක්ෂණ බලපත්‍ර අළුත්කිරීමට කටයුතු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර 44ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගැසට්පත්‍රය ප්‍රකාරව කටයුතු කරන බව. | ගැසට්පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.33,728,379 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.24,690,240 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම රු. "000" | බිල්කළ ආදායම රු. "000" | රැස්කළ ආදායම රු. "000" | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. "000" | ඇස්තමේන්තුගත ආදායම රු. "000" | බිල්කළ ආදායම රු. "000" | රැස්කළ ආදායම රු. "000" | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු."000" |
| වරිපනම් හා බදු | 2,336 | 692 | 464 | 6,782 | 1,735 | 445 | 371 | 6,555 |
| කුලී | 35,832 | 27,142 | 26,924 | 13,154 | 35,266 | 21,847 | 18,605 | 12,936 |
| බලපත්‍ර ගාස්තු | 2,879 | 1,154 | 1,154 | 39 | 2,326 | 1,090 | 1,090 | 39 |
| වෙනත් ආදායම් | 2,452 | 1,208 | 1,208 | 406 | 2,116 | 999 | 999 | 406 |
| එකතුව | 43,499 | 30,196 | 29,750 | 20,381 | 41,443 | 24,381 | 21,065 | 19,936 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| 1946 අංක 30 දරණ වරිපනම් හා තක්සේරු පනතේ 20 වගන්තිය අනුව වසර 05කට වරක් වරිපනම් තක්සේරු කළ යුතු වුවත් සභාව වසර 19කින් වරිපනම් තක්සේරු කර නොතිබුණි. | ඉල්ලීම් කර ඇති බව. | තක්සේරුව කඩිනම් කළ යුතුය. |
| **(ආ) කුලී** | | |
| **(I) බස් නැවැතුම්පළ කඩකාමර කුලී** | | |
| (i) 2022 දෙසැම්බර් 31 දිනට වසර 05කට අධික කාලයක සිට පවතින හිඟහිටි කාමර කුලී රු. 1,165,422ක් විය. | හිඟමුදල් අයකර ගැනීමට විධිවිධාන ක්‍රියාත්මක කරන බව. | හිඟමුදල් අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) 2014 වර්ෂයේ අත්සන් කළ කඩකුලී ගිවිසුමේ 2 වගන්තිය ප්‍රකාරව, 2016 වර්ෂයේ සිට පෙර කුලී වටිනාකමින් වාර්ෂිකව සියයට 10ක් වැඩිකර කුලී අයනොකිරීම හේතුවෙන් සභාවට රු. 455,383ක ආදායම් අහිමි වී තිබුණි. | හිඟමුදල් සම්පූර්ණයෙන් අයකර ගැනීමට කටයුතු කරන බව. | ගිවිසුම් ප්‍රකාරව කුලී අයකළ යුතුය. |
| **(II) මස්කඩ කුලී** | | |
| කුකුළු මස්කඩවලින් කුලී අයකිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා අතුරු ව්‍යවස්ථාවල කිසිදු විධිවිධාන සලසා නොතිබුණි. 2009 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා හිඟහිටි කුලී රු.12,469,466ක් අයකර ගෙන නොතිබුණි. | හිඟහිටි කුකුළු මස්කඩ කුලී ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ප්‍රකාරව කපාහැරීමට කටයුතු කරන බව. | ගිවිසුම් අනුව හිඟහිටි කඩ කුලී අයකර ගත යුතුය. |
| **(ඇ) මුද්දර ගාස්තු** | | |
| පළාත් සභාවේ නියෝජ්‍ය ලේකම් සහ අනෙකුත් බලධාරීන්ගෙන්, 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 4,548,533ක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ලංකා බැංකුව සහ මහජන බැංකුවේ ඉතිරි කිරීම් ගිණුම්වල රු. 572,909ක ශේෂයක් වර්ෂ 13කට අධික කාලයක් අක්‍රියව | ඉතුරුම් කිරීමේ ගිණුම්වලින් ලැබෙන පොලී අවසන් ගිණුම්වල දැක්වේ. ඉදිරියේදී මේවා ස්ථාවර තැන්පතුවල තැන්පත් කිරීමට | මුදල් ඵලදායී ලෙස යොදාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පැවැතුණි. | කටයුතු කරන බව. | |
| (ආ) | 1980 අංක 46 දරන සේවක නියුක්තිකයන්ගේ අරමුදල් (ETF) පනතේ 16 වගන්තිය අනුව නියමිත දිනට දායක මුදල් නොගෙවීම හේතුවෙන් රු.31,800ක් දඩ ලෙස සභා අරමුදලින් ගෙවා තිබුණි. | ඉදිරි කාලයේදී මෙවැනි ගෙවීම් සිදුකිරීම වැළැක්වීමට පියවර ගන්නා බව. | සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් නියමිත දිනයට ගෙවිය යුතුය. |

**3.2 නිෂ්කාර්ය සහ ඌන උපයෝජිත දේපළ**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තෝප්පූර්හි 2014 වර්ෂයේදී රු. 4,967,426ක පිරිවැයකින් ඉදිකළ කඩකාමර 12කින් යුත් කඩකාමර සංකීර්ණය වර්ෂ 08ක සිට කුලියට දීමට පියවර ගෙන නොතිබුණි. | ඉදිරියේදි අළුත්වැඩියා කර කුලියට දීමට කටයුතු කරනු ලැබේ. | අදාල අරමුණු වෙනුවෙන් භාවිතා කළ යුතුය. |
| (ආ) | සාම්පූර්හි රු.3,669,340ක පිරිවැයකින් 2017 වර්ෂයේ ඉදිකළ වෙළෙඳපොල ගොඩනැගිල්ල වර්ෂ 05ක සිට භාවිතා කර නොතිබුණි. | කුලියට ලබාගැනීමට ව්‍යාපාරිකයින් ඉදිරිපත් නොවීම හේතුවෙන් ඉදිරියේදී විකල්ප ක්‍රියාමාර්ග යොදන බව. | -එම- |
| (ඇ) | පළාත් නිශ්චිත සංවර්ධන මූල්‍ය ප්‍රතිපාදන යටතේ රු. 1,115,226ක් වූ ජීව වායු (Bio Gas) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට 2016 දෙසැම්බර් 07 දින ගොඩනැගිල්ලක් කොන්ත්‍රාත්කරු විසින් ඉදිකර සභාවට භාරදී තිබූ නමුත් මේ දක්වා එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවැතුණි. | ජීව වායු නිෂ්පාදන ගොඩනැගිල්ල ප්‍රමාණවත් තාක්ෂණික උපදෙස් හා යන්ත්‍ර නොලැබීම හේතුවෙන් ක්‍රියාත්මක නොවීය. ඒ සඳහා සම්පත් ලැබූ විටෙක ඉදිරි කාලයේදි වායු නිෂ්පාදන කටයුතු සිදු කරන බව. | -එම- |
| (ඈ) | පළාත් නිශ්චිත සංවර්ධන මූල්‍ය ප්‍රතිපාදන යටතේ රු. 2,589,515 ක් වූ මුතූර් විනෝදාස්වාද උද්‍යානයේ බෝට්ටු නැවැත්වීමේ (Boat landing) ව්‍යාපෘතිය, 2019 දෙසැම්බර් 06 දින අවසන් කර සභාවට භාරදී තිබූ නමුත් මෙම වාර්තාවේ දිනය දක්වා භාවිතා නොකර නිෂ්කාර්යව පැවැතුණි. | විවිධ අවස්ථාවන්හි ප්‍රයත්න දැරූ නමුත් මේ දක්වා බෝට්ටුවේ ගමන් කිරීමට අනුමැතිය ලැබී නොතිබුණි. අනුමැතිය ලැබීමෙන් පසුව කටයුතු කරන බව. | -එම- |
| (ඉ) | යුනිසෙෆ් මූල්‍ය ප්‍රතිපාදන යටතේ 2012 අගෝස්තු 22 දින සභාවට ලබාදුන් Sewerage Treatment Plant මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | තාක්ෂණික උපදෙස් හා යන්ත්‍ර නොලැබීම හේතුවෙන් ක්‍රියාත්මක නොවීය. ඒ සඳහා සම්පත් ලැබූ විටෙක ඉදිරි කාලයේදි කටයුතු සිදු කරන බව. | -එම- |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **පවරා නොගත් වත්කම්** | | |
| පරිත්‍යාග ලෙස ලැබුණු වාහන 29ක් සභාව විසින් පරිහරණය කර තිබුණු නමුත් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන කිහිපයක් පවරා ගෙන ඇති නමුත් ඇතැම් වාහන ලබාදුන් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ ආදිය අහෝසි කිරීම්වලදී එවැනි අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු විධිමත්ව හඳුනාගත නොහැකි නිසා මේ පිළිබඳව නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම්වරයාගේ උපදෙස් ලබාගැනීමට ක්‍රියමාර්ග ගෙන ඇති බව. | පවරා ගැනිමට සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වේ. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **සේවක ණය** | | |
| වසර 11කට පෙර අනියම් සේවකයෙකුට ලබාදුන් රු.102,620ක ආපදා ණය මුදලක් හා සමාලෝචිත වර්ෂයේ නිරවුල් කළයුතු රු.323,750ක් හිඟව පැවැතුණි. | සමාලෝචිත වර්ෂයේ නිරවුල් කළයුතු රු.323,750ක් අයකිරීමට කටයුතු කරන බව. | හිඟ අය කිරිමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාවේ අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර තිබුණත්, විගණන කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි. | 2020, වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන කාර්යයන් සිදුකර නොතිබුණු බව. | අභ්‍යන්තර විගණන කාර්යයන් සිදු කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇස්තමේන්තු කළ වියදම් සහ තථ්‍ය වියදම් අතර සියයට 24 සිට සියයට 81ක් දක්වා විචලනයන් වූ බැවින් අයවැය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි. | අයවැය මගින් අපේක්ෂා කළ ආදායම් සම්පූර්ණයෙන් ලබාගත නොහැකි වීම නිසා එයට අදාල වියදම් සිදුකිරීමට නොහැකි වූ බව. | විශාල පරාසයක විචලනයන් වලක්වා ගැනිමට උචිත ක්‍රියාමාර්ග ගතයුතුය. |